**අතිගරු ජනාධිපතිතුමන්ගේ පණිවුඩය,**



සමාජ ශිෂ්ඨාචාරයේ ප්‍රගමනය සමග ජනාවාසකරණය කෙරෙහි ලොව හැමගේ අවධානය යොමුව තිබේ. වඩාත් හොඳ දිවිපෙවෙතක් සඳහා ගමෙන් නගරයට සේන්දුවීම තුළින් නාගරීකරණ ගැටළුව වඩාත් සංකීර්ණවී තිබේ. මේ සියළු ක්‍රියාකාරිකම් හේතුවෙන් නාගරීකරණය ආශ්‍රිත ජනාවාස ගැටළුව අවශ්‍යයෙන්ම විසඳුම් සෙවිය යුතු කරුණක් බවට පත්වී ඇත.

එක්සත් ජාතීන්ගේ හැබිටැට් සංවිධානය වාර්ෂිකව ජගත් ජනාවාස දිනය සැමරීම තුළින් උත්සාහ ගන්නේ මේ සඳහා විසඳුමක් සෙවීමටය.

සහජීවනය විවිධ අයුරින් අර්ථ දැක්වීය හැකිවේ . ජනාවාසය හා නාගරීකරණය තුළ එය වඩාත් අර්ථාන්විත වදනකි. නගරය, ජනාවාසය හා නිවහන යන ත්‍රිත්වය අතර සමතුළිත බවක් ඇතිකරලීම සහජීවන නගරයක උදාවයි.

මහින්ද චින්තනය තුළින් ක්‍රියාවට නැංවෙන ජනසෙවණ ජාතික නිවාස වැඩසටහන තුළින් අප රජය උත්සාහ කරන්නේ නගරයේ සංවර්ධනය ගමට ගලායාම ඉඩකඩ සලසා, ගමත් නගරයත් අතර සහජීවනය ගොඩනැගීමයි. විවිධ ගැටළු වලින් බැහැර වු සහජීවන නගරයක් උදාකිරීමේ දී රටේ බහුතර ජන කොටසක් ජීවත්වන ගම තුළ ද එවැනිම සහජීවනයක් ගොඩනැගීම අවශ්‍ය වේ.

එවන් වූ ක්‍රියාදාමයක අප රජය යෙදී සිටින මෙවන් අවස්ථාවක මෙවර ලෝක ජනාවාස දින තේමාව “ සහජීවන නගර” වශයෙන් නම් කිරිම වඩාත් කාලෝචිත බව මගේ හැඟීමයි.

සහජීවන නගර ක්‍රියාවලිය හුදෙක් එක් දිනකට පමණක් සීමා නොකොට එය වඩාත් ඵලදායී වැඩපිලිවෙලක් බවට පත් කිරීමට මෙවර ලෝක ජනාවාස දින අදිටන් කරගනිමු .

**මහින්ද රාජපක්ෂ**
**ජනාධිපති**